රහසිගතයි

Right to Information Commission
1899
28 MAR 2022

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION | අමාත්‍ය මණ්ඩල තීරණය | அமைச்சரவைத் தீர்மானம்

My No : CP/DEC/22
Date : 2022-03-23

Director General
Right to Information Commission of Sri Lanka

## CABINET DECISIONS - 2022-03-14

The decision in respect of under mentioned reference number made at the Cabinet Meeting held on 2022-03-14 is sent herewith.

W.M.D.J. Fernando
Secretary to the Cabinet of Ministers

22/Misc(015)

250

Prepared by:

Checked by :

රහසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION අමාත්‍ය මණ්ඩල තීරණය அமைச்சரவைத் தீர்மானம்

මගේ අංකය: 22/විවිධ(015) 2022 මාර්තු මස 22 දින.

**පිටපත්:**

ජනාධිපති ලේකම්.
නීතිපතිතුමා.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.
අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු දැනගැනීමේ
අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව.
විගණකාධිපති.

**ක්‍රියා කළ යුතු:**

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්.

**2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩල තීරණ සහ ඒ ආශ්‍රිත ලේඛන නිකුත් කිරීම**

2022 මාර්තු මස 14 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

**ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු**
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

51. **2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩල තීරණ සහ ඒ ආශ්‍රිත ලේඛන නිකුත් කිරීම** - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩල තීරණ සහ ඒ ආශ්‍රිත ලේඛන ලබා ගැනීමට අදාළව අමාත්‍ය මණ්ඩල කාර්යාලයට එරෙහිව සමස්ත ලංකා පරිපාලන නිලධාරීන්ගේ සංගමය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අංක RTIC/Appeal/1988/2020 දරන

→ 2

අභියාචනය සම්බන්ධයෙන් වන එම කොමිෂන් සභාවේ 2022-02-08 දිනැති තීන්දුව අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් අමාත්‍ය මණ්ඩලයේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලදී. එකී තීන්දුව පිළිබඳව පැවති සාකච්ඡාව අතරතුරදී අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරන ලදී:

(I) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත 2017-02-03 දින බලාත්මක වීමෙන් පසු අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් එම පනතේ විධිවිධාන පරිදි කටයුතු කිරීමට නොපමාව පියවර ගෙන ඇති බව;

(II) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ කාර්යය සඳහා "අමාත්‍ය මණ්ඩලය" ද 'පොදු අධිකාරියක්' වන බවට අංක RTIC/Appeal /216/2018 දරන අභියාචන විභාගයේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති 2018-07-17 දිනැති අතුරු නියෝගයෙහි ස්ථාවරය පිළිගනිමින් අමාත්‍ය මණ්ඩලය විසින් පහත (III)හි සඳහන් ක්‍රමවේදය හඳුන්වා දීමට තීරණය කරනු ලැබ ඇති බව;

(III) අංක 19/විවිධ(010) හා 2019-02-26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2019-03-07 දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මඟින් දක්වා ඇති තොරතුරුවලට ප්‍රවේශය ලබා දිය නොහැකි හේතූන්ට යටත් වෙමින් සිය අමාත්‍යාංශ/කාර්යාල මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල තීරණ හා ඒවාට සම්බන්ධිත තොරතුරු, එකී පනතේ විධිවිධාන යටතේ පුරවැසියන් වෙත ලබා දීමේ බලය අමාත්‍ය මණ්ඩලය විසින් ජනාධිපති ලේකම්වරයාට, අග්‍රාමාත්‍ය ලේකම්වරයාට, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ ලේකම්වරුන්ට සහ අමාත්‍ය මණ්ඩලයේ නොවන අමාත්‍යාංශ ලේකම්වරුන්ට පවරා ඇති බව;

→ 3

(IV) ඉන් අනතුරුව, ඉහත (II) හි සඳහන් අංක RTIC/Appeal/216/2018 දරන අභියාචනයෙහි 2019-04-02 දිනැති අවසන් නියෝගය අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලය ද පොදු අධිකාරියක් වන බවට අර්ථනිරූපනය කරනු ලැබ ඇති බව;

(V) අංක RTIC/Appeal/1988/2020 දරන අභියාචනයේ 2022-02-08 දිනැති තීන්දුව අනුව අදාළ තොරතුරු අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් සෘජුවම අභියාචක වෙත නිකුත් කළ යුතු බවට තීරණය කරනු ලැබ ඇති බව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති අමාත්‍ය මණ්ඩල කාර්යාලය ද පොදු අධිකාරියක් වන බැවින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය භාරයේ පවතින අමාත්‍ය මණ්ඩල සංදේශ, තීරණ හා සම්බන්ධිත තොරතුරු පුරවැසියන් වෙත පනතේ විධිවිධාන අනුව නිකුත් කිරීමට එම කාර්යාලය බැඳී සිටින බවත්, එම විධිවිධානවලින් බැහැරව සිදු කෙරෙන තීන්දු තීරණ මඟින් අදාළ වගකීමෙන් නිදහස් වීමට එම කාර්යාලයට නොහැකි බවත් එකී කොමිෂන් සභාව විසින් 2022-02-08 දිනැති තීන්දුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති බව;

(VI) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ ඉහත (V)හි සඳහන් තීරණය හේතුවෙන්, 2019-02-26 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු නිකුත් කිරීමේදී දැනට අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය යළි සමාලෝචනය කළ යුතු බව;

(VII) අමාත්‍ය මණ්ඩල සංදේශ හා ඊට අදාළ අනෙකුත් ලේඛන අමාත්‍යාංශ විසින් රහස්‍ය තොරතුරු වශයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත සැපයෙන බැවින්, එවැනි තොරතුරු පුරවැසියන් වෙත නිකුත් කිරීමේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 29 වගන්තියේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු බව;

→ 4

(VIII) විවිධ අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශ, වාර්තා, ඒ සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණ වැනි තොරතුරු විශාල ප්‍රමාණයක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය භාරයේ පවතින බව සහ ඒවායේ අන්තර්ගත ඇතැම් තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) වගන්තිය යටතේ පුරවැසියන් වෙත ප්‍රවේශය ලබා දිය නොහැකි හේතූන්ට යටත් විය හැකි බව;

(IX) එකී හේතූන් පිළිබඳව වඩාත් නිවැරදිව තීරණය කිරීමේ හැකියාව අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශයේ හෝ කාර්යාලයේ අදාළ නිලධාරීන් වෙත පවතින බව;

(X) ඉහත කී තත්ත්වය යටතේ අමාත්‍ය මණ්ඩල සංදේශ හා ඒ හා සම්බන්ධිත තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන පරිදි පුරවැසියන් වෙත කඩිනමින් නිකුත් කිරීමේ හැකියාව අමාත්‍ය මණ්ඩල කාර්යාලයට වඩා අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය හෝ ඒ සම්බන්ධ තොරතුරු අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශ හෝ කාර්යාල වෙත පවතින බව; සහ

(XI) එබැවින්, ඒ සඳහා විධිවිධාන සැලසීම පිණිස 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට යෝග්‍ය සංශෝධන හඳුන්වා දීම හෝ වෙනත් විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා දීම වඩාත් යෝග්‍ය බව.

මේ පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

(i) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ 2022-02-08 දිනැති තීරණය පරිදි අදාළ තොරතුරු අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් අභියාචක වෙත නිකුත් කිරීම;

(ii) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ 2022-02-08 දිනැති තීරණය සහ ඉහත (I) සිට (XI) දක්වා වන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් නීතිපතිගේ ද අදහස් ලබා ගනිමින්,

→ 5

අමාත්‍ය මණ්ඩල සංදේශ, තීරණ හා ඒ හා සම්බන්ධිත තොරතුරු සෘජුවම අදාළ අමාත්‍යාංශ සහ කාර්යාල විසින් පුරවැසියන් වෙත නිකුත් කිරීම පිණිස අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලෙස අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටීම; සහ

(iii) ඉහත (ii)හි සඳහන් පරිදි කටයුතු කරනු ලබන තෙක්, වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලදුව අමාත්‍ය මණ්ඩල කාර්යාලය භාරයේ ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ, තීරණ සහ ඒ හා සම්බන්ධිත තොරතුරු ඉල්ලා ඉදිරිපත් වන පුරවැසි ඉල්ලීම් සම්බන්ධයෙන්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 29(2) වගන්තියේ විධිවිධාන අනුව එකී අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ එකඟතාව ලබා ගැනීමට යටත්ව, අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් අදාළ තොරතුරු නිකුත් කිරීම.

ක්‍රියා කළ යුතු: **අධිකරණ අමාත්‍යාංශය** - ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.

පිටපත්: **ජනාධිපති ලේකම්** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**නීතිපතිතුමා** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**අග්‍රාමාත්‍ය ලේකම්** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**ජනමාධ්‍ය අමාත්‍යාංශය** - ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**මුදල් අමාත්‍යාංශය** - ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව** - කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීම පිණිස.

51. **Issuance of Cabinet decisions and related documents under the provisions of the Right to Information Act, No.12 of 2016** - the Secretary to the Cabinet brought to the notice of the Cabinet the decision dated 2022-02-08 of the Right to Information Commission pertaining to the Appeal No.RTIC/Appeal/1988/2020 submitted to the said Commission by the All Island Administrative Officers' Union against the Office of the Cabinet of Ministers with regard to obtaining Cabinet decisions and related documents in terms of the provisions of the Right to Information Act. During the deliberations on the said decision, the Cabinet observed the following:

(I) that, the Office of the Cabinet of Ministers has taken measures in terms of the provisions of the Right to Information Act, No.12 of 2016 without delay, after the said Act came into operation on 2017-02-03;

(II) that, accepting the stand of the Interim Order dated 2018-07-17 issued by the Right to Information Commission during the hearing of the Appeal No.RTIC/Appeal/216/2018 to the effect that the 'Cabinet of Ministers' is a 'Public Authority' for the purpose of the Right to Information Act, the Cabinet has decided to introduce the procedure referred to at (III) below;

(III) that, the Cabinet of Ministers has authorized the Secretary to the President, Secretary to the Prime Minister, Secretaries to Cabinet Ministries and Secretaries to Non-Cabinet Ministries, for the issuance of Cabinet decisions and related information on Cabinet Memoranda submitted by their Ministries/ Offices to the citizens, in terms of the Right to Information Act, subjected to the grounds of refusal of access to information specified in the said Act with effect from 2019-03-07, in terms of the Cabinet decision dated 2019-02-26 on Item No.19/Misc. (010);

(IV) that, thereafter, it has been interpreted that the Office of the Cabinet of Ministers is also a Public Authority in terms of the Final Order dated 2019-04-02 on the Appeal No.RTIC/Appeal/216/2018 referred to at (II) above;

**Contd./2-**

(V) that, in terms of the decision dated 2022-02-08 on the Appeal No.RTIC/Appeal/1988/2020, it has been decided that the Office of the Cabinet of Ministers should issue the related information directly to the Appellant and the said Commission by its decision dated 2022-02-08 has declared that, since the Office of the Cabinet of Ministers established under the Constitution is also a Public Authority, the Office of the Cabinet of Ministers is obligated to issue Memoranda, decisions and related information in its custody, to the citizens in terms of the provisions of the said Act, and the said Office cannot relieve itself from the said responsibility by the decisions taken deviating from the said provisions;

(VI) that, in view of the decision referred to at (V) above of the Right to Information Commission, the present procedure followed by the Office of the Cabinet of Ministers in issuing information in terms of the Right to Information Act as instructed by the Cabinet of Ministers on 2019-02-26, has to be reviewed again;

(VII) that, since the Cabinet Memoranda and other related documents are submitted by the Ministries to the Office of the Cabinet of Ministers as confidential information, action should be taken in terms of the provisions of section 29 of the Right to Information Act when issuing such information to the citizens;

(VIII) that, a large volume of information such as Cabinet Memoranda and Reports submitted by various Ministries and related Cabinet decisions are in the custody of the Office of the Cabinet of Ministers and access to certain information included therein to the citizens, could be subjected to the grounds of refusal of access to information in terms of section 5(1) of the Right to Information Act;

Contd./3-

(IX) that, the expertise in determining more precisely on such grounds, rests with the relevant officials of the Ministry or the Office which submitted the relevant Cabinet Memorandum;

(X) that, under the circumstances, the ability of issuing Cabinet Memoranda and related information to the citizens expeditiously in terms of the provisions of the Right to Information Act, rests more with the Ministries or Offices which submitted the Cabinet Memoranda or related information, than that of the Office of the Cabinet of Ministers; and

(XI) that, as such, in order to make provisions for the purpose, it would be more appropriate to introduce suitable amendments to the Right to Information Act, No.12 of 2016 or introduce any other alternative procedure.

After further discussion, it was decided -

(i) to issue the relevant information to the Appellant by the Secretary to the Cabinet of Ministers, as per the decision of the Right to Information Commission dated 2022-02-08;

(ii) to request the Minister of Justice to seek the views of the Attorney General too on the decision of the Right to Information Commission dated 2022-02-08 and the observations (I) to (XI) above and submit recommendations to the Cabinet on the procedure to be followed for the issuance of Cabinet Memoranda, decisions and related information directly to the citizens by the relevant Ministries and Offices; and

**Contd./4-**

(iii) to issue the relevant information by the Office of the Cabinet of Ministers in respect of the citizens' applications seeking Cabinet Memoranda, decisions and related information, in the custody of the said Office, submitted by other Ministries, subject to obtaining the concurrence of the Secretaries to such Ministries in terms of the provisions in section 29 (2) of the Right to Information Act, until action is taken as per (ii) above.

Action by: **My/Justice** - to be brought to the notice of the Hon. Minister - copy each of the relevant documents annexed.

Copied to: **Secretary to the President** - copy each of the relevant documents annexed.
**Attorney General** - copy each of the relevant documents annexed.
**Secretary to the Prime Minister** - copy each of the relevant documents annexed.
**My/Mass Media** - to be brought to the notice of the Hon. Minister - copy each of the relevant documents annexed.
**My/Finance** - to be brought to the notice of the Hon. Minister - copy each of the relevant documents annexed.
**Director General, Right to Information Commission** - to be brought to the notice of the Commission

Checked by : 1..........
2 .......... 03/22